WWW.OLEVELAPI.COM



[සියලු ම හිමිකම් ඇවිරිණි ] [முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය I, II<br>கிறிஸ்தவம் I, II<br>Christianity I, II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** 'වනාන්තරයේ සමිඳුන්හට මාවතක් එළි කරන්න.' මෙසේ පැවසුවේ කවු ද?
(1) දිවැසිවර යෙසායා (2) දිවැසිවර මීකා (3) දිවැසිවර මලාකි (4) දිවැසිවර ආමොස්

**2.** සෙකරියස් හා එලිසබෙත් යන දෙදෙනාට ම පොදු චරිතාංග **නොවූයේ**
(1) ධර්මිෂ්ඨකම හා ඇදහිල්ලයි. (2) ප්‍රශංසාව හා සැකයයි.
(3) අනුමානය හා නිහතමානිත්වයයි. (4) තේරුම් කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාවයි.

**3.** මරියතුමියගේ ජීවිතාදර්ශය අනුව ඔබ විශේෂයෙන් ම,
(1) ඕනෑම පණිවිඩයකට ක්ෂණික ප්‍රතිචාර දැක්විය යුතු ය.
(2) ඥාතීන්ට සැලකිලි දැක්විය යුතු ය.
(3) දේව කැමැත්තට අවනත විය යුතු ය.
(4) ශුභාරංචි ප්‍රාර්ථනා කළ යුතු ය.

**4.** පිලිප්පියේ දී කාන්තා නායකත්වය දැරුවේ,
(1) ප්‍රිස්කිලා ය. (2) දොර්කස් ය.
(3) ලිදියා ය. (4) නපුරු ආත්මයෙන් නිදහස් වූ කාන්තාව ය.

**5.** දිවැස්වර යෙසායාට අනුව ජේසුස් වහන්සේ,
(1) බෙත්ලෙහෙමේ විසූවන්ට බලාපොරොත්තුවක් විය. (2) ගලිලයේ විසූවන්ට ආලෝකයක් විය.
(3) බැබිලෝනියානු විප්‍රවාසීන්ට සොම්නසක් විය. (4) දිවැස්වරුන්ට මහත් බලපෑමක් විය.

**6.** පිලාත් ජේසුතුමා කුරුසිපත් කිරීමේ තීරණය දුන්නේ,
(1) නීතියට ගරු කළ බැවිනි. (2) ජනතා උද්ඝෝෂණය ප්‍රබල වූ බැවිනි.
(3) බරබ්බස් නිදහස් කිරීමට අවශ්‍ය වූ බැවිනි. (4) ජේසුතුමා නිදහස නොඉල්ලූ බැවිනි.

**7.** කිතුනු බෞතිස්මයේ දී හිමිවන දේව වරප්‍රසාද කුමක් ද?
A. ශුද්ධාත්මයාණන් තුළින් වන නව ජීවිත පැවැත්මයි.
B. ශාරීරික පවිත්‍රතාවයයි.
C. සමාජ පිළිගැනීම හිමිවීමයි.
D. පාප කමාව ලැබීමයි
මින් වඩාත් නිවැරදි වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) A සහ D ය. (4) B සහ D ය.

**8.** ස්නාවක ජොහාන් අද සමාජයට පැමිණියොත් සාමාන්‍ය ජනයාට කියනු ඇත්තේ කුමක් ද?
(1) සාධාරණත්වයේ වටිනාකම (2) නිවැරදිව නිල බලය යෙදවීමේ වටිනාකම
(3) ක්‍රියාකාරී ඇදහිල්ලක වටිනාකම (4) බෙදා ගැනීමේ වටිනාකම

**9.** "මා පියාණන්ගේ මැඳුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහු ද?" මින් අපට ලැබෙන මඟ පෙන්වීම වන්නේ,
(1) දේව රාජ්‍යයේ මෙහෙවර වටහා ගත යුතු බවයි. (2) වැඩිහිටියන්ගේ දැනුම පිරික්සිය යුතු බවයි.
(3) නිතර දෙවි මැඳුරෙහි රැඳී සිටිය යුතු බවයි. (4) දෙමාපිය ඇසුරින් වුව ද ඈත්විය යුතු බවයි.

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**10.** දේව රාජ්‍යයේ වර්ධනය පතන්නන්,
(1) කිතුනු සභාවන් පුළුල් කළ යුතු ය. (2) බාධක නැති බවට උපකල්පනය කළ යුතු ය.
(3) සැම කල්හිම එකම වර්ධනයක් පැතිය යුතු ය. (4) දේව බලය කෙරේ විශ්වාසය තැබිය යුතු ය.

**11.** සාමය යථාර්තයක් වීම සඳහා,
(1) දේශපාලන ස්ථාවරත්වයන් පැවතීම අත්‍යාවශ්‍ය වේ. (2) යුක්තිය හා ධර්මිෂ්ඨකම ඉටුවීම අත්‍යවශ්‍ය වේ.
(3) ප්‍රචණ්ඩත්වය හෙළා දැකීම අත්‍යවශ්‍ය වේ. (4) අනුන් විනිශ්චය කිරීමෙන් වැළකීම අත්‍යවශ්‍ය වේ.

**12.** ඔබේ ඉඟ පටිය බැඳ ගන්න. පහන් ද දල්වා තබා ගන්න. මෙයින් අනාවරණය කෙරෙන සත්‍යයක් **නොවන්නේ,**
(1) අපේක්ෂාවෙන් සිටීම ය. (2) සූදානමින් සිටීම ය.
(3) දැනුම් දෙනතෙක් සිටීම ය. (4) අවදිව ඉවසිල්ලෙන් සිටීම ය.

**13.** යහපත් එඬේර ගුණාංග අනුව කිතුනු නායකයින්,
(1) ඔවුන්ගේ අධිකාරිත්වය ප්‍රකාශ කළ යුතු ය. (2) රැළේ ස්වභාවය අධ්‍යයනය කළ යුතු ය.
(3) රැළ සංඛ්‍යාත්මකව වර්ධනය කළ යුතු ය. (4) කැපවීමෙන් යුතුව රැළ පෝෂණය කළ යුතු ය.

**14.** ප්‍රේමයේ විශිෂ්ටත්වය හෙළිවන්නේ,
(1) දෙවිඳුන්ට හා අවශ්‍යතා ඇති අයට ප්‍රේම කිරීමෙනි. (2) නපුරට යටත් නොවීමෙනි.
(3) වැඩිහිටියන්ට අවනත වීමෙනි. (4) විනීතව හැසිරීමෙනි.

**15.** සාම යුගය ගැන පැවසුවේ,
(1) දිවැසිවර ආමෝස් ය. (2) දිවැසිවර මීකා ය.
(3) දිවැසිවර මලාකි ය. (4) දිවැසිවර හොසියා ය.

**16.** රෝම ගමනේ දී කුණාටුවට මුහුණ දුන් පාවුල්ගෙන් පන්නරය ලබන කිතුනුවන් ජීවත අර්බුදවල දී,
(1) ධන සම්පත් පරිහරණය කළ යුතු ය. (2) අර්බුදවල ස්වභාවය හඳුනාගත යුතු ය.
(3) ප්‍රශ්නවලින් පලා යා යුතු ය. (4) ඇදහිල්ලෙන් සාක්ෂි දැරිය යුතු ය.

**17.** සාකෙවුස්ගේ ජීවිත පරිවර්තනයට ප්‍රධාන හේතුව වූයේ,
(1) තම වරද අවබෝධ කර ගැනීමට ගත් උත්සාහයයි. (2) ජේසුතුමා හමුවීමට තිබූ ආශාවයි.
(3) ජේසුතුමා ඔහුව පිළිගැනීමයි. (4) ජනතාව ඔහුව කොන් කිරීමයි.

**18.** ජේසුතුමා මෙන් අද කිතුනුවා මුහුණ දෙන කාලීන පරීක්ෂාවන් වන්නේ,
A. ආහාර සැපයීමේ අභියෝගයයි
B. නපුරේ බලයට කීකරු වීමේ අභියෝගයයි
C. ජනප්‍රියතාවය දිනාගැනීමේ අභියෝගයයි
D. දේව බලය මෙහෙයවීම පිළිබඳ අභියෝගයයි

මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A සහ B ය. (2) B සහ C ය. (3) B සහ D ය. (4) C සහ D ය.

**19.** සාධාරණය හෙළි කරන ප්‍රකාශනයක් වන්නේ,
(1) මාගේ පාපවලින් මා පිවිතුරු කළ මැනව යන්න ය.
(2) යුක්තිය ගලා බසින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳ ගලන ගඟක් මෙන් ද පැවතිය යුතුය යන්න ය.
(3) ඔවුහු තමන්ගේ කඩුවලින් නගුල් ද හෙල්ල වලින් දැකැති ද හදා ගත්තෝය යන්න ය.
(4) එකිනෙකා තම තමාගේ මිදි වැල යට ද අත්තික්කා ගස යට ද යෙහෙන් වාසය කරනු ඇත යන්න ය.

WWW.OLEVELAPI.COM

**20.** පාවුල් එපීසයේ දී කළ දැ ඇසුරෙන් අද ඇතැම් කිතුනුවන් මුහුණ දෙන අභියෝගය නම්,
(1) රැකියාවෙන් ඉවත් වූව ද නව මාර්ග සෙවීමයි. (2) මිත්‍යා මතවලින් වැළකී එකම දෙවිඳුන් නැමදීමයි.
(3) අරගල හමුවේ පැසුබෑමයි. (4) වැරදි දැ අනුකරණයට පෙළඹීමයි.

**21.** දේවගැති සේවය සඳහා වූ කැඳවීමකට ලත් වැදගත් ම ප්‍රතිචාරය වූයේ,
(1) දේවධර්මය හදාරා පැමිණෙමි යන්නයි.
(2) සොයුරියන්ගේ අධ්‍යාපනය නිමවූ විට පැමිණෙමි යන්නයි.
(3) උසස් අධ්‍යාපනය මදකට පසෙක ලා පැමිණෙමි යන්නයි.
(4) මුළු කාලය සේවයට කැප කරමින් පැමිණෙමි යන්නයි.

**22.** සමාජයේ නොමඟ ගිය දරුවන් ගැන කිතුනු ඔබේ වගකීම වන්නේ,
(1) ඔවුන්ට දේව රාජ්‍යයේ අපේක්ෂා වටහා දීමයි.
(2) ඔවුන් නොමඟ යාමට හේතු විමසීමයි.
(3) මනස්ථාපනය තුළ දේව දරුකම පෙන්වා දී පිළිගැනීමයි.
(4) ඔවුන්ට පාපයේ භායනකකම පහදා දීමයි.

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**23.** දුක් විඳින සේවකයා අනුගමනය කරන කිතුනුවා සේවයේ දී,
(1) දුක් විඳීම තුළින් බැහැර විය යුතු ය.
(2) දුක් විඳීමේ දී හා වැයවීමේ දී ජයග්‍රාහී විය යුතු ය.
(3) දුක් පීඩා හමුවේ දී දේව කැමැත්ත සෙවිය යුතු ය.
(4) දුකට පත්වූවන්ට අනුකම්පාව දැක්විය යුතු ය.

**24.** මුල් ගෝලයින්ගෙන් අද කිතුනු සභාවට එල්ල වන ප්‍රබල අභියෝගය වන්නේ,
(1) මිනිසුන් සතුටු කිරීමයි.
(2) නායකත්වයට අවනත වීමයි.
(3) විවිධත්වය තුළ එකමුතුකමයි.
(4) ධීවර කාර්යයේ යෙදීමයි.

**25.** දේව රාජ්‍යයේ උරුමය ලැබීමේ භාග්‍යය දිළිඳුන්ට හිමි වන්නේ,
(1) ඔවුන්ගේ අඟහිඟකම් සපිරෙන බැවිනි.
(2) ඔවුන් දෙවිඳුන් තුළ රැඳී සිටින බැවිනි.
(3) ධනවත් වීම අභාග්‍යයක් බැවිනි.
(4) ඔවුන්ට සිනාසීමට හැකිවන බැවිනි.

**26.** පීඩනයට පත්වන්නන්ට ඉශ්‍රායෙල් ඉතිහාසයෙන් ලැබෙන මඟපෙන්වීම වන්නේ,
(1) නිරතුරුව දෙවිඳුන් අයැදීමයි.
(2) පීඩකයින්ට විරුද්ධව කෙඳිරීමයි.
(3) පීඩකයින්ට විරුද්ධව නැඟී සිටීමයි.
(4) පීඩනය දරාගෙන සිටීමයි.

**27.** ජේසුතුමාගේ ජයාන්විත ජෙරුසලම් ගමනින් පන්නරය ලබන කිතුනුවා,
(1) නිහතමානීවම පමණක් ක්‍රියා කළ යුතු ය.
(2) සාමයෙන් සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතු ය.
(3) වීදිවල ජයඝෝෂා නැඟිය යුතු ය.
(4) වීර ලීලාවෙන් කටයුතු කළ යුතු ය.

**28.** අරිමාතියේ ජෝසෙප්ගේ ක්‍රියා කලාපය සුවිශේෂී වන්නේ ඔහු,
(1) ජේසුතුමාගේ මෘත දේහයට ගෞරව දැක්වූ බැවිනි.
(2) ජුදෙව්වන්ගේ ක්‍රියා කලාපය හෙළාදුටු බැවිනි.
(3) ජේසුතුමා ළඟින් ඇසුරු කළ කෙනෙකු බැවිනි.
(4) තීරණාත්මක අවස්ථාවක සත්‍යයට සාක්ෂි දැරූ බැවිනි.

**29.** ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් ජේසුතුමා තුළ සම්පූර්ණ වීම අනාවරණය වූයේ එතුමා,
(1) ජෝර්දාන් ගඟේ බෞතිස්මය ලැබූ විට ය.
(2) ජීවමාන ජේසුස් වහන්සේ බවට පේදුරු සාක්ෂි දැරූ විට ය.
(3) කන්දක් මත රූප විපර්යාසය අත්දුටු විට ය.
(4) උත්ථානයෙන් පසු ගෝලයින්ට දර්ශනය වූ විට ය.

**30.** ජේසුතුමාගේ ගෙත්සෙමනේ යැදුම අනුගමනය කරන ඔබ,
(1) අධ්‍යාත්මික ගැටුමට මුහුණ දිය යුතු ය.
(2) සතුරන් වෙනුවෙන් අයැදිය යුතු ය.
(3) ජනතාවට සාමය උදාකළ යුතු ය.
(4) ආත්මාර්ථය නසා දේව කැමැත්තට ඉඩදිය යුතු ය.

**31.** ජේසුතුමා පැවසූ පරිසිවරුන්ගේ ඇතුළාන්ත හිස්කමට නිදසුනක් වන්නේ,
(1) කෙනෙකු දෙව් මැඳුරු ශාලාව විශාල කොට තම නම කෙටීමයි.
(2) කෙනෙකු මියගිය අයකුගේ නැති ගුණ පැවසීමයි.
(3) කෙනෙකු ශාරීරික පවිත්‍රතාවය ගැන මහත් සේ සැලකීමයි.
(4) කෙනෙකු වැඩිහිටි නිවාසයක් සඳහා මුල්ගල තැබීමයි.

**32.** ආබ්‍රහම්ගේ හා මොසෙස්ගේ බලාපොරොත්තු අතිශයින් වැදගත් වූයේ,
(1) ඒවා දේව කැමත්ත ඉටු කිරීමේ බලාපොරොත්තු වූ නිසා ය.
(2) ඒවා සමාජ නායකත්ව වර්ධනය කිරීමේ බලාපොරොත්තු වූ නිසා ය.
(3) ඒවා ඉටුකර ගැනීමේ දී දුක් පීඩා ඇති නොවූ නිසා ය.
(4) ඒවා සාමූහික බලාපොරොත්තු වූ නිසා ය.

WWW.OLEVELAPI.COM

**33.** වර්තමානයේ සමාජය මුදල් පසුපස හඹා යන්නේ මන් ද?
A. දකින අසන දේ පිළිබඳව ආකර්ෂණය වන බැවිනි.
B. සමාජය පරාර්ථකාමිත්වයෙන් වෙළී ඇති බැවිනි.
C. ජනතාව දහමට ඇළුම් වන බැවිනි.
D. තරඟකාරිත්වය සමාජය වසාගෙන ඇති බැවිනි.
මින් වඩාත් නිවැරදි වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) A සහ D ය. (4) C සහ D ය.

**34.** "රෝගාතුරව සිටියෙමි. ඔබ මා බලාගන්නාහු ය." මෙම ජේසුස් වහන්සේගේ ප්‍රකාශය සැබවින් ම ප්‍රායෝගික වූයේ,
(1) රෝගී වූ පියාට ප්‍රතිකාර කිරීමට පුතා පියාව විදේශ ගත කිරීමෙනි.
(2) රෝගී වූ දිළිඳු කතකට සහා සාමාජිකයින් මුදලක් යැවීමෙනි.
(3) ඒ දුගියා ලැබූ මුදලින් කොටසක් දිනපතාම පිළිකා රෝහලට යැවීමෙනි.
(4) හදිසි අනතුරකට මුහුණ පෑ හිතවතිය බැලීමට ඔහු දිනපතාම රෝහලට යෑමෙනි.

[හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**35.** පේදුරුතුමා අභියෝග ඉදිරියේ නොසැලුණු අවස්ථාවකට නිදසුනක් වන්නේ,
(1) පේදුරුතුමා ජේසුස්වහන්සේ නාඳුනන බව පැවසූ අවස්ථාවයි.
(2) මන්ත්‍රණ සභාවෙන් අවසර නොලැබුව ද දේශනා කළ අවස්ථාවයි.
(3) ජේසුස් වහන්සේ නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ අවස්ථාවයි.
(4) පෙන්තකොස්ත දින දේශනය පැවැත්වූ අවස්ථාවයි.

**36.** දිළිඳු වැන්දඹුවගේ පූජාවෙන් කිතුනුවාට ලැබෙන පණිවිඩය වන්නේ,
(1) පූජාවේ ඇතුළත් ත්‍යාගශීලිත්වය සැලකීම ය.
(2) සූදනන්ගේ වත් පොහොසත්කම් සැලකීම ය.
(3) පූජාවේ සංඛ්‍යාත්මක වටිනාකම වැඩි කිරීම ය.
(4) පූජාවේ ඉලක්කය තීරණය කිරීම ය.

**37.** මුල් සභාවේ ධර්ම දූත මෙහෙවර තුළින් අද කිතුනු සභාවට ලැබෙන ප්‍රබල ආදර්ශය නම්,
(1) දිනපතා නමස්කාර හා සුව මෙහෙයන් පැවැත්වීමයි.
(2) මුළු කාලයම ධර්මදූත මෙහෙවරට යෙදීමයි.
(3) ජීවමාන ජේසුතුමා ගැන සාක්ෂි දැරීම හා ඉගැන්වීමයි.
(4) සුබ සාධන මෙහෙවර සඳහා ජනතාව උනන්දු කරවීමයි.

**38.** සභා එකමුතුවක් සඳහා විශේෂයෙන් අවධාරණය කළ යුත්තේ,
(1) ක්‍රිස්තුස් වහන්සේ හිස වන නිසා මුළු ශරීරය ඒකාබද්ධ කරන බවයි.
(2) ක්‍රිස්තුස් වහන්සේ ජාතීන් අතර වෛරයේ මැද බිත්තිය කැඩූ බවයි.
(3) ක්‍රිස්තුස් වහන්සේ කුරුසියෙන් ලැබෙන කමාව අවධාරණය කළ යුතු බවයි.
(4) ප්‍රේරිතවරුවන් සියල්ල පොදුවේ තබා ගත යුතු බවයි.

**39.** වර්තමාන බහුවිධ සමාජය තුළ සහජීවනය ඇති කිරීමේ නියැළෙන කිතුනුවා,
(1) සියලු බාධක අභිබවමින් දේව ප්‍රේමය සමාජය තුළ පතළ කළ යුතු ය.
(2) සියලු විශ්වාසවල සමානත්වයක් ඇති බව පිළිගත යුතු ය.
(3) පරිසරය සුරැකීමේ මාර්ග සොයා බැලිය යුතු ය.
(4) ආරාධනා නැති වුව ද සංස්කෘතික උත්සවවලට සහභාගී විය යුතු ය.

**40.** යෙසායාට දිව්‍යසිවර කැඳවීම ලැබුනේ කුමක් සඳහා ද?
A. අන්‍යජාතීන්ගේ පාපය කමා කිරීමට ය.
B. ජනතාවගේ ඇදහිල්ල වර්ධනය කිරීමට ය.
C. දෙවිඳුන්ගේ ශුද්ධවන්තභාවය ප්‍රකාශ කිරීමට ය.
D. දුෂ්කර කටුක කර්යභාරයක් කිරීමට ය.
මින් වඩා වැදගත් වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) A සහ D ය. (4) C සහ D ය.

* *

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....